# අකීකරු වලස් පුංචා



දිසිනි රනුල්යා දම්සති

# අකීකරු වලස් පූංචා

දිසිනි රනුල්යා

කතෘ

පාසල - මහනුවර මහාමායා බාලිකා විදුහල

පංතිය - 8 G

ප්‍රථම මුද්‍රණය - 2025/01/10

978-624-208-478-7 (ISBN)

පාසල් නිවාඩු කාලයේ මා විසින් රචනා කළ මෙම කෙටි කතාව මාගේම අදහස් වලින් යුක්ත වේ. "හෙරණගත්කරණී" ලෙස අප රටේ පැවැත්වෙන

ග්‍රන්ථකරණ වැඩසටහන මඟින් මට මෙම අවස්තාව උදා කර දෙනු ලැබීය.

"අකීකරු වලස් පුංචා" යන මාගේ මෙම ළමා කතා පුවතෙන් ඔබට ගත හැකි ආදර්ශය වනුයේ "දෙමව්පියන්ගේ බසට අවනත වී කටයුතු කළ යුතුයි."යන්නයි.

පුංචි ඔබටත් "හෙරණගත්කරණී" වැඩසටහන සමඟ අත්වැල් බැඳගන්නා ලෙස ආදරයෙන් ආරාධනා කරමු.

# පිදුම

මා විසින් ලියන ලද

මෙම ළමා කෘතිය

මා මෙතෙක් කල් ආදරයෙන්

රැක බලා ගත්

දෙමව්පියන්ට ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේ ම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කරුවන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණය ට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

978-624-208-478-7 (ISBN)

එකෝමත් එක කාලෙක ගංගා, දියඇලි, ගස් වැල් වගේ ම ලස්සන සතුන්ගෙන් පිරුණු වනාන්තරයක් තිබුණා. ඒ වනයේ විවිධ වර්ගයේ සතුන් හිටියා.

කොටියෝ, සිංහයෝ, වලස්සු, හාවෝ වගේම තව ගොඩාක් සතුන් හිටියා. ඉතින් මේ වනයේ එක කොනක තිබ්බා ලස්සන පොඩි ගල් ගුහාවක්. ඒ ගල් ගුහාවේ ලස්සන වලස් පවුලක් ජීවත් වුණා. මේ ගල් ගුහාවේ වලස් අම්මයි, තාත්තයි, පුතයි සතුටින් ජීවත් වුණා.

මේ ගල් ගුහාවට පෙනෙන නොපෙනෙන දුරින් මී පැණි බේරෙන මී වදයක් තිබුණා. මී පැණි කියන්නේ වලස්සුන්ගේ ආසම කෑමක් නේ.

ඉතින් ඔයාලම හිතන්නකෝ වලස් පුංචට මොනවා හිතෙන්න ඇද්ද කියලා. වෙන මුකුත් නෙවෙයි, එයාට ඒ මී වදයෙන් මී පැණි ටිකක් කන්න හිතුණා.



මේ ගැන වලස් පුංචාගේ අම්මයි, තාත්තයි හොඳට ම දැනගෙන තමයි හිටියේ. එයාලා වලස් පුංචාට අවවාද කළා " අපිට නොකියා මී වදය ළඟට යන්නවත් එපා " කියලා.

ඒ වගේ ම වලස් පුංචාගේ අම්මයි, තාත්තයි මී වදයකින් ඇති අවදානම ගැන වලස් පුංචාට කියලයි තිබුණේ.

වලස් පුංචා හැමදා ම ගල් ගුහාවේ ඉඳන් මී වදය දිහා බලා ගෙන හිටියා. වලස් පුංචාට මේ මී වදයෙන් මී පැණි ටිකක් කන්න ම හිතුණා. වලස් පුංචා අම්මයි, තාත්තයි දුන්න අවවාදය අමතක කළා.

ඊළඟ දවසේ  වලස් අම්මයි, තාත්තයි වෙනදා වගේ ම කෑම හොයන්න උදේ පාන්දරින් ම පිටත් වුණා. එයාලා යන්න කලින් වලස් පුංචාට අවවාදය ගැන මතක් කරලයි ගියේ.

ඒ වුණාට වලස් පුංචා අම්මගෙයි, තාත්තගෙයි අවවාදය ගානකටවත් ගත්තේ නෑ.

වලස් පුංචා අම්මයි, තාත්තයි නොපෙනී යනකම් ම බලා ගෙන ඉඳලා හිමින් හිමින් ගල් ගුහාවෙන් එළියට ආවා.



එයා දැක්කා රන්වන් පාට මී පැණි මී වදයෙන් බේරෙනවා. වලස් පුංචා වටපිට බලලා හෙමින් හෙමින් මී වදය ළඟට කිට්ටු වුණේ මී පැණි ටිකක් කන්න හිතා ගෙන.

මේ මී වදයේ තියෙන මී පැණි දැකලා පුංචාගේ කටට කෙල ඉණුවා. මේ වෙලාවේ මී වදයේ හිටියේ මී මැසි රැජිනයි එයාගේ සේවකයෝ ටික දෙනා විතරයි. මී වදයේ අනික් පිරිස මල් පැණි එකතු කරන්න අසල තිබුණු මල් වත්තට ගිහිල්ලයි හිටියේ.

ඉතින් ඔය අතරේ වලස් පුංචා මී පැණි කන්න ගහට නගිමින් තමයි හිටියේ. මේක දැකපු මී මැසි රැජිනගේ සේවකයෝ මේ ගැන මී මැසි රැජිනට කිවුවා. මේක අහපු මී මැසි රැජින මී පැණි එකතු කරන්න ගියපු මී මැස්සන්ව එක්කන් එන්න කියලා එයාගේ සේවකයන්ව යැවුවා. ඊට පස්සෙ මී මැසි රැජින ඇතුළු අනෙක් පිරිස මී වදයෙන් එලියට ආවා.

වලස් පුංචා හිමින් හිමින් මී වදයට කිට්ටු වෙලා මී වදය කඩා ගත්තා.



මී වදය පරිස්සමෙන් අරන් ඇවිත් ළඟ තිබුණු ලොකු ගලක් උඩ වාඩි වෙලා මී පැණි රසවිඳින්න පටන් ගත්තා.

මේ අතර මී මැසි ආරක්ෂකයෝ එකා දෙන්නා වලස් පුංචාගේ වටේ කැරකි කැරකී වලස් පුංචාට කරදර කරන්න පටන් ගත්තා.

දැඩි කෑදර කමින් හිටපු වලස් පුංචාට තමන්ට වෙන්න යන දේ ගැන පොඩ්ඩක්වත් දැනුණේ නෑ.

මේ අතරේ මී මැසි රැජින යැවූ පණිවිඩය දැන ගත්ත එළියේ හිටපු මී මැස්සෝ හැමෝම මී වදය ළඟට ආවා. මී වදය කඩා ගෙන මී පැණි කන වලස් පුංචාව දැකලා මී මැසි රැනට ගොඩාක් කේන්ති ගියා.



එයාලා මේ වලස් පුංචාට අනින්න පටන් ගත්තා. මෙයාලාගෙන් බේරෙන්න බැරිම තැන වලස් පුංචා ළඟ තිබුණු පොකුණකට පැන්නා.

එයාට දැන් වතුරෙන් එළියට එන්න බැරිවයි ඉන්නේ. මොකද මී මැස්සෝ බලන් ඉන්නවා වලස් පුංචාට අනින්න.

ඔය අතරේ කෑම සොයන් ගෙදර ආපු වලස් අම්මයි, තාත්තයි වලස් පුංචාව හෙවුවා. වලස් පුංචා ගෙදර නැති බව දැන ගත්තහම එයාලා හිතුවා පුංචා මී වදය ළඟට යන්න ඇති කියලා. එයාලා ඉක්මනින් එතනට ගියා. යනකොට මෙයාලා දකිනවා මී මැස්සන්ගෙන් බේරෙන්න වලස් පුංචා වතුරේ හැංගිලා ඉන්න හැටි. මෙයාලා ඉක්මනින් ගිහින් මී මැස්සන්ව පැන්නුවා.



ඊට පස්සේ වලස් පූංචා වතුරෙන් එලියට ආවා. එතකොට අම්මා කියුවා "ඔයා අපි කියපු දේ ඇහුවනම් ඔයාට මෙහෙම වෙන්නෙ නෑ නේ පුතේ."කියලා.

ඊට පස්සේ වලස් පූංචා කිව්වා"අනේ අම්මේ , තාත්තේ මට සමා වෙන්න. මම ආයෙ එහෙම කරන්නෙ නෑ. මම අම්මයි, තාත්තයි කියන දේ අහන්නම්."කියලා.

ඊට පස්සේ වලස් පූංචා ආයෙ අම්මටයි , තාත්තාටයි අකීකරු වුනේ නෑ. එයාලා සතුටින් හැමදාම ජීවත් වුනා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවම අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි ය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන් ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක්ද ගොඩ නගා තිබේ.තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාසිංශන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්

# අකීකරු වලස් පූංචා

මාගේ මෙම ළමා කතා පුවතෙන් පූංචි ඔබට ගත හැකි ආදර්ශය වන්නේ "තමාගේ දෙමව්පියන්ට අකීකරු නොවී කීකරුව ජීවත් වීම" වේ.

අදහස් හා රූප

දිසිනි රනුල්යා දම්සති



978-624-208-478-7 (ISBN)